**තරිඳු ජයවර්ධන එ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 545/2018 (2018.12.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණි වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - **තරිඳු ජයවර්ධන**
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධරයා **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

**පෙනීසිටීම**
අභියාචක - **තරිඳු ජයවර්ධන**
පොදු අධිකාරිය - හර්ෂ විජේවර්ධන, අතිරේක ලේකම්
ඩබ් ජී ඩී සුමනසේකර, කළමනාකරණ සහකාර

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.07.09 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.08.03, 2018.08.16, 2018.08.16 |
| නම් කල නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.08.28 |
| නම් කල නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.09.20 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.07.09 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *අමාත්‍යාංශ සංචිතයේ ඇති වාහන සංඛ්‍යාව*
2. *අමාත්‍යාංශ සංචිතයේ ඇති වාහන වර්ග හා එම වාහනවල අංක*
3. *අමාත්‍යාංශයේ වාහන භාවිත කරන පිරිසගේ නම් ලැයිස්තුව සහ ඔවුන්ට දී ඇති වාහනයේ වර්ගය සහ අංක*
4. *අමාත්‍යාංශයේ වාහන වල රියදුරන් හා ඔවුන්ට අදාළ වාහනය*
5. *අමාත්‍යාංශයේ වාහන සඳහා 2015 වසරේ තෙල් වියදම් සහ නඩත්තු වියදම්*
6. *අමාත්‍යාංශයේ වාහන සඳහා 2016 වසරේ තෙල් වියදම් සහ නඩත්තු වියදම් (වාර්ෂිකව)*
7. *2016 සහ 2017 අමාත්‍යාංශයේ වාහන සඳහා තෙල් සහ නඩත්තු වියදම් වෙන වෙනම (වාහනයෙන් වාහනයට)*
8. *කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන ගණන සහ රියදුරන් ගණන. (වාහන අංක වෙන වෙනම)*

තොරතුරු නිලධාරියා 2018.08.03 දිනැතිව පිළිතුරු සපයමින් අංක 01 සිට 06 දක්වා හා අංක 08 යටතේ තොරතුරු අමුණා ඇති අතර අංක 07 යටතේ ඉල්ලා ඇති තොරතුරු සැපයීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා ඇත. නැවත තොරතුරු නිලධාරියා විසින් අත්සන් කරන ලද ලිපි දෙකක් 2018.08.16 දින අමාත්‍යවරයාගේ මාධ්‍ය අංශය විසින් අභියාචකගේ නිවසට ගෙනැවිත් දුන් අතර එම අවස්ථා දෙකේදී අංක 8 සඳහා ලබා දුන් ප්‍රතිචාර වෙනස් වූ අතර තොරතුරු නිලධාරියා විසින් එවන ලද මුල් ප්‍රතිචාරයටද හාත්පසින්ම වෙන විය.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.08.28 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. එම අභියාචනයේ අභියාචක පවසා සිටියේ තොරතුරු ඉල්ලීමේ අංක 08 යටතේ ඉල්ලා ඇති සංඛ්‍යාවට 2018.08.03 දිනැති ලිපිය මගින් වාහන 10ක් ලෙස දැක්වුවද, 2018.08.16 දිනැතිව දුරකථනය මාර්ගයෙන් අමාත්‍යවරයා පවසා සිටියේ තමාට වැඩිපුර වාහන දෙකක් පමණක් ලබා දී ඇති බවයි. ඉන් පසුව, ඇමතිවරයාගේ මාධ්‍ය කණ්ඩායමක් මාර්ගයෙන් 2018.08.16 දිනැති 102/04/01/191 දරණ ලිපිය මගින් මුල් තොරතුරු ලබා දුන්නේ අතපසුවීමකින් බවත් ඇමතිවරයාට ලබාදී ඇත්තේ වාහන 5ක් පමණක් බවත් දන්වා ඇත. එම ලිපිය ලද පසු අමාත්‍යාංශ ලේකම්වරයා අභියාචක වෙත දුරකතනයෙන් කතා කර යළිත් පවසා සිටියේ දෙවැනි ලිපියෙන් වැරදි වැටහීමක් ඇති විය හැකි බැවින් එයද වෙනස් කළ යුතු බවයි. ඉන් අනතුරුව එදිනම සවස තොරතුරු නිලධාරියා අභියාචක වෙත ලිඛිතව අමාත්‍යවරයා වාහන 3ක් භාවිතා කරන බව දැනුම් දෙන ලදී. අභියාචනය කිරීමේ පදනම එකම කරුණට අදාළව අවස්ථා තුනකදී පිළිතුරු තුනක් ලබා දීමත් තොරතුරු නිලධාරියා හට කරන ලද බලපෑමක් මත මුල් තොරතුරු වෙනස් කිරීමක් සිදුවී ඇති බව හැඟී ගිය බැවින්ය.

නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.09.20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචනය විභාග කරන අවස්ථාවේදී අභියාචක පවසා සිටියේ ඔහු 2017.11.12 සහ 2017.10.23 දිනයන්හි තොරතුරු ඉල්ලීම් මගින් අමාත්‍යාංශයේ පවතින වාහන සම්බන්ධයෙන් තොරතුරු තොරතුරු ඉල්ලා සිටි බවත් එම අවස්ථාවන්හිදී එයට පිළිතුරු නොලැබුන බැවින් හා පනත ප්‍රකාරව ඉදිරි පියවර ගැනීමට අපොහොසත් වූ බැවින් 2018.07.09 දිනැතිව එම ඉල්ලීම නැවත සිදු කළ බවයි. එම අවස්ථාවේදී තොරතුරු නිලධාරියා තොරතුරු ඉල්ලීම ලැබුණු බව දන්වා එවන ලද අතර තොරතුරුද 2018.08.03 දිනැතිව අභියාචක

වෙත ලබා දෙන ලදී. අභියාචක මාධ්‍යවේදියකු වශයෙන් මෙම තොරතුරු වල සත්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා, පුවත්පතෙහි මේ සම්බන්ධයෙන් තමා රචිත ලිපිය පළ වීමට ප්‍රථමව අමාත්‍යවරයාට දුරකථන ඇමතුමක් ලබාදී සිටි අවස්ථාවේදී අමාත්‍යාංශයේ මාධ්‍ය අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද බවත් මාධ්‍ය අධ්‍යක්ෂ තමා අමාත්‍යාංශයේ ලේකම් වෙතත් යොමු කළ බව පවසා සිටින ලදී. ඒ අනුව ලේකම්වරයාට කතා කරන ලද අතර ලේකම්වරයාද අභියාචක තොරතුරු නිලධාරියා ලෙස පත්ව සිටි පුද්ගලයා ලබා දුන් තොරතුරු නම් එම තොරතුරු සත්‍ය තොරතුරු විය යුතු බවත් පවසා සිටින ලදී. ඒ අනුව අභියාචක එම තොරතුරු පුවත්පතෙහි පළ කරන ලදී.

මින් අනතුරුව අභියාචක ලේකම්වරයාට නැවත කතා කළ විට ලේකම්තුමා පවසා සිටියේ තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාරය ප්‍රකාරව වාහන සංඛ්‍යාව 10ක් නොව 5ක් බවත් එම නිවැරදි කිරීම පුවත් පතෙහි සිදු කරන ලෙසටත් ය. තවද පවසා සිටියේ අමාත්‍යවරයාට පිට පළාත් වල රාජකාරීකිරීමට සිදුවන බැවින් වැඩිපුර වාහන ලබාදී ඇති බවත්ය. ඉන්පසුව අභියාචක වෙත දුරකතනයෙන් තොරතුරු නිලධාරියාද කතා කොට වාහන 10ක් නොමැති බවත් එම අවස්ථාවේදී මාධ්‍ය අධ්‍යක්ෂ අතට දුරකථනය ලබා දුන් බවත් පවසා සිටින ලදී. ඉන්පසු අමාත්‍යවරයාගේ පෞද්ගලික මාධ්‍ය අංශය අභියාචකගේ නිවාස වෙත 2018.08.16 දිනැතිව තොරතුරු නිලධාරියා විසින් ලියන ලද ලිපයක් භාර දෙන ලදී. එම ලිපියෙහි සඳහන් වූයේ අමාත්‍යවරයා වෙත ලබාදී ඇති වාහන සංඛ්‍යාව 5ක් බවත් ඉන් 2ක් අමාත්‍යවරයා උතුරු නැගෙනහිර පළාත්වල රාජකාරී කටයුතු සඳහා යන බැවින් භාවිත කරන බවත් ය. මින් පසු අභියාචකද ජාතිවාදී බව පවසමින් twitter ඔස්සේ අපහාසයට ලක් වීමට සිදුවූ අතර, සවස නැවත වරක් තම නිවසට තොරතුරු නිලධාරියා විසින් ලියන ලද තවත් ලිපියක් මාධ්‍ය අංශය විසින් ගෙනවිත් භාර දෙන ලදී. එහි අත් වැරදීමකින් පෙර ලිපියේ (එනම් 2018.08.16 දිනැති ලිපියේ) වාහන 5ක් බව සඳහන් වී ඇති බවත් නිලවශයෙන් පවතින්නේ වාහන තුනක් බවත් තොරතුරු නිලධාරියා පවසා ඇත.

මෙම අවස්ථාවේදී අභියාචක අවධාරණය කර සිටියේ තොරතුරු නිලධාරියට යම්කිසි බලපෑමක් සිදුකොට විවිධ අවස්ථාවන්හිදී ලබා දී ඇති තොරතුරු වෙනස් කරන බවට හැගී යන බවයි.

පොදු අධිකාරිය පවසා සිටියේ මේ වන විට තොරතුරු නිලධාරියා මේ වන විට ස්ථාන මාරුවක් ලබා ගොස් ඇති බවත් දැනට අමාත්‍යවරයාට වාහන තුනක් ඇති බවත් තවත් වාහන දෙකක් ව්‍යාපෘති සඳහා භාවිත කරන බවත්ය. තවද අතිරේක ව්‍යාපෘති සඳහා සාමාන්‍යයෙන් වාහන 8ක් වෙන්කර තිබෙන බවත් වෙනත් නිලධාරියෙක් නොමැති වීම හේතුවෙන් අමාත්‍යවරයා යටතේ මෙම වාහන පවතින ලෙසත් පවසා සිටින ලදී. තවද අභියාචක වෙත නිවැරදි කරුණු ලබා දිය යුතු බැවින් මෙම පිළිතුර/ පැහැදිලි කිරීම් තොරතුරු නිලධාරියා විසින් වරින් වර වෙනස් කරන ලද බවත් පවසා සිටින ලදී.

අභියාචක විමසා සිටියේ එක් දිනක් තුළ වාහන 5, තුන බවට පත්වීම් කෙසේද යන්නත්, තවදුරටත් පවසා සිටියේ මෙලෙස පිළිතුරු වරින් වර වෙනස් වීම ගැටළු සහගත බවත්ය. අභියාචක මෙම පරස්පර විරෝධී ප්‍රතිචාරවලින් සත්‍ය තත්ත්වය දැනගැනීම පිණිස මෙම වාහන වල ධාවන සටහන් ඉල්ලා තොරතුරු ඉල්ලීමක් සිදු කර ඇති බවද පවසා සිටින ලදී.

අභියාචක තවදුරටත් පවසා සිටියේ මෙවැනි සිද්ධීන් සාමාන්‍යීකරණය වුවහොත් පොදු අධිකාරිය තුළ මෙවැනි සිදුවීම් නැවත නැවතත් සිදුවීමට ඇති හැකියාවද වැඩි වන බවයි.

පොදු අධිකාරියෙන් තොරතුරු නිලධාරියා වෙත යම් බලපෑමක් ඇතිවුනේද යන්න පිළිබඳව ප්‍රශ්න කර සිටියදී, පොදු අධිකාරිය නියෝජනය කරමින් පැමිණ සිටි අතිරේක ලේකම් තුමා පවසා සිටියේ එසේ කිසිදු බලපෑමක් නොතිබුණු බවත් වඩාත් පැහැදිලි හා නිවැරදි පිළිතුරක් ලබා දීමට ගත් ප්‍රයත්නයක් බවත්ය.

පොදු අධිකාරිය විසින් නිල වශයෙන් මෙම තත්ත්වය සම්බන්ධයෙන් ගත පියවර සම්බන්ධයෙන් විමසා සිටියදී තොරතුරු නිලධාරියට කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිය හැකි බවත් පවසා සිටින ලදී.

**නියෝගය:**

පනතේ 39 (1) (ඊ) වගන්තිය ප්‍රකාරව තොරතුරු නිලධාරියා විසින් පනත ප්‍රකාරව තම රාජකාරිය සිදු කරමින් සිටියදී එය වැලැක්වීමට හෝ අවහිර කිරීම සිදු කරන්නේ නම් එය දඬුවම් ලැබිය හැකි වරදක් බවත් අවධාරණය කරනු ලැබේ. පනතේ 39 (1) (ඊ) පහත පරිදි වේ.

> *මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ එම කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාව හෝ එහි යම් නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වළක්වන හෝ අවහිර කරනු ලබන... සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පනස්දහසක්න නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක්නො ඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතු ය.*

තවද 39 (1) (ආ) වගන්තිය ප්‍රකාරව 'පොදු අධිකාරියේ ඔහු හෝ ඇයගේ සේවා නියුක්තිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ලබා ගත් දැනුම හෝ තමා වෙත ප්‍රවේශයක් ඇති, තොරතුරු චේතනාන්විතව විනාශ කරනු ලබන, අවලංගු කරනු ලබන, වෙනස් කරනු ලබන හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් වසන් කරනු ලබන' තැනැත්තෙකුද දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරයි.

2018.08.16 දිනැතිව තොරතුරු නිලධරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද ලිපි මුල් ප්‍රතිචාරයට වඩා වෙනස්වීම, එම ලිපි, තොරතුරු නිලධරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබුවද, අමාත්‍යවරයාගේ මාධ්‍ය අංශය විසින් අභියාචක වෙත ලබා දීම, සහ දුරකථන ඇමතුම් මාර්ගයෙන් කතා කළ අවස්ථාවේදී මාධ්‍ය අංශයද ප්‍රතිචාර දැක්වීම මගින් තොරතුරු නිලධාරියා වෙත බලපෑමක් සිදු වී ඇත්ද යන්න මෙම අවස්ථාවේදී උද්ගතවන ප්‍රශ්නයකි.

ඒ අනුව මෙම අවස්ථාවේදී පරස්පර විරෝධී ප්‍රතිචාර ලබා දීමට හේතු සහ තොරතුරු නිලධාරියා යම් කිසි බලපෑමක් මත තම ප්‍රතිචාරය වෙනස් කළේද යන්න සොයා බැලීම සඳහා විමර්ශනයක් සිදු කොට කොමිෂන් සභාව වෙත වාර්තාවක් සපයන ලෙසට පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ.

මීළඟ කැඳවීමේ දිනය: 2018.01.29

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.

*****